# ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය -2010

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.2.1 විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

----------------------------------------------------

2005 වර්ෂයේදී රු.මිලියන 2,309.3 ක්වූ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ශේෂය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 319.5 ක ඍණ ශේෂයක් දක්වා පහත දැක්වෙන පරිදි අඩුවී තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල සටහන් අනුව, 2010 අගෝස්තු අවසානය වන විට සියළුම අරමුදල් අවසානවී තිබුණ අතර, ඉන්පසු මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් මණ්ඩලයේ පවතින වෙනත් අරමුදල්වලින් කෙටි කාලීන ණය ලබා ගනිමින් සිදුකර තිබුණ. එබැවින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අනාගත පැවැත්ම සම්පූර්ණයෙන්ම රජයේ ප්‍රදාන මත රදා පවතී. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලේ අනාගත බැරකම රු.බිලියන 29.5 ක් වේ.

| වර්ෂය | අරමුදලේ ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 2005 | 2,309.3 |
| 2006 | 2,003.7 |
| 2007 | 1,639.8 |
| 2008 | 1,404.8 |
| 2009 | 663.8 |
| 2010 | (319.5) |

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණ.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රතිපත්තිය වෙනස්වීම් සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණම්කරණ ප්‍රමිත 24 ප්‍රකාරව රජයේ ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රදාන ඒවායින් හිලව් කිරීමට අදහස් කරන සම්බන්ධිත පිරිවැය සමඟ ගැලපීමට අවශ්‍ය කෙරෙන කාලපරිච්ඡේදයන් තුල ක්‍රමවත් පදනමක් මත ආදායම් ලෙස හඳුනාගත යුතුය. යෝජනා ක්‍රමය විසින් මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 හා 42 ප්‍රකාරව අනාගත විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(ඉ) පසු සේවා ප්‍රතිලාභ බැදීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හා 42 ප්‍රකාරව සුදුසුකම් ලැබූ ආයුගණකඥයෙකුගේ සේවය ලබා ගනිමින් හෝ පාර්තෝෂික සූත්‍ර ක්‍රමයක් යොදා ගනිමින් සදුකල යුතුය. කෙසේ වුවද ඉහත අවශ්‍යතාවයට අනුකූලවන පරිදි පාර්තෝෂික බැරකම් ගණනය කර නොතිබුණි.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

1992 වර්ෂයේ සිට 2007 දක්වා උපලබ්ධි නොවූ ලෙස පැවතුණ, බැංකු ගිණුම් 3 ක තැන්පත් කරන ලද චෙක්පත් 117 කට අදාලව රු.1,179,624 ක් වූ උපලබ්ධි නොවූ තැන්පතුවල වටිනාකම අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම්වල වූ රු.125,079,264 ක ලැබිය යුතු ශේෂ නවයක් වර්ෂ තුනකට වැඩි කාලයක සිට අයකරගත නොහැකිව පැවතුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දැක්වෙන රු.8,306,122 ක් වූ ලැබිය යුතු ගිණුම්වලින් රු.2,328,439 ක් එනම් 28% ක් පමණක් 2011 අප්‍රේල් 21 දක්වා අදාල පාර්ශවයන් විසින් සනාථ කර තිබුණි.

(ඇ) එකතුව රු.1,682,031 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු දීර්ඝ කාලයක සිට නිරවුල් කර නොතිබණි.

1.2.5 පැහැදිලි නොකල වෙනස්කම්

---------------------------------

2010 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව, ආදායම් ගිණුමට අයකරන ලද සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකය පිළිවෙලින් රු.4,789,305 ක් හා රු.1,132,352 ක් විය. සේවක අර්ථසාධක අරමුදල දායක ගණනය සඳහා සැලකිල්ලට ගන්නා ලද මුළු වැටුප රු.39,910,878 ක් වූ අතර සේවක භාරකාර අරමුදල ගණනය සඳහා එය රු.37,745,071 ක් විය. සියලුම සේවකයන් එම අරමුදල් දෙකටම නිශ්චිත ප්‍රතිශතයක් යටතේ දායකවීමට හිමිකම් ලබා තිබුණද, සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීම සඳහා සැලකිල්ලට ගන්නා ලද වැටුප රු.2,165,807 කින් අඩුවී තිබුණි. මෙම වෙනස සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

විගණනයේදී පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 395 ප්‍රකාරව බැංකු ගිණුම් දෙකකට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

(ආ) 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 06 දරන චක්‍රලේඛය මගින් සංශෝධිත 2006 - ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව යෝජනා ක්‍රමය සඳහා නව මෘදුකාංග වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසලට (UCSC) රු.1,475,000 ක් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනාක්‍රමයේ වැඩකටයුතුවලින් රු.984,711,579 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු741,312,102 ක වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.243,399,477 ක එනම් 32.8% ක පිරිහීමක් තවදුරටත් දැක්වුණි. විස්තර පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | විචලනය |
|---|---|---|---|
| | 2010 | 2009 | |
| | රු. | රු. | ප්‍රතිශතය |
| මුළු ආදායම | 210,398,099 | 362,467,131 | (41.9) |
| මුළු වියදම | 1,195,109,678 | 1,103,779,233 | 8.3 |
| වර්ෂය සඳහා ඌනතාවය | (984,711,579) | (741,312,102) | (32.8) |

#### 2.1.2 මූල්‍ය ප්‍රතිඵලවල හා මූල්‍ය තත්ත්වයේ විග්‍රහාත්මක සමාලොචනය

(අ) පරිපාලන වියදම්වලින් කොටසක් රජයේ ප්‍රදානවලින් දරා තිබුණද, අරමුදලේ මූල්‍ය තත්ත්වය අවදානම් සහිත තත්ත්වයක විය. යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රතිඵලය 2002 වර්ෂයේ රු.මිලියන 214 ක අතිරික්තයක් වූ අතර එය 2010 වර්ෂය වන විට රු. මිලියන 985 ක ඌනතාවයක් දක්වා පහත දැක්වෙන පරිදි පිරිහී තිබුණි. එබැවින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පැවැත්ම පිළිබඳ බරපතල අවිනිශ්චිත තත්ත්වයක් ඇතිවී තිබේ.

| විස්තරය | 2010 | 2009 | 2008 | 2007 | 2006 | 2005 | 2004 | 2003 | 2002 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| මුළු ආදායම | 210 | 362 | 716 | 527 | 530 | 382 | 413 | 403 | 481 |
| මුළු වියදම | (1,195) | (1,103) | (951) | (891) | (744) | (545) | (460) | (351) | (267) |
| අතිරිකතය / (ඌනතාවය) අරමුදලට මාරු කිරීම් | (985) | (741) | (235) | (364) | (214) | (163) | (47) | 52 | 214 |

(Column group heading: වර්ෂය)

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සහ පසුගිය වර්ෂ 5 ක් සඳහා ගොවීන්ගෙන් යෝජනාක්‍රමය සඳහා රැස්කරන ලද දායකයන් හා ගෙවන ලද විශ්‍රාම වැටුප් පහත දැක්වේ.

| වර්ෂය | දායක මුදල් | විශ්‍රාම වැටුප් ගෙවීම |
|---|---|---|
| | රු. මිලියන | රු.මිලියන |
| 2005 | 161.8 | 415.2 |
| 2006 | 214.7 | 550.3 |
| 2007 | 222.6 | 685.7 |
| 2008 | 163.1 | 809.1 |
| 2009 | 148.7 | 955.6 |
| 2010 | 136.7 | 1,044.7 |

(ඇ) යෝජනා ක්‍රමයේ ප්‍රාග්ධනය හා සංචිත 2005 වර්ෂයේදී රු.මිලියන 2,529.2 සිට 2010 වර්ෂය වන විට රු.මිලියන 295.3 ක එනම් 111.7% ක ඍණ ශේෂයක් දක්වා අඩුවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ප්‍රාග්ධන ශේෂය හා සංචිත |
|---|---|
| | රු. මිලියන |
| 2005 | 2,529.2 |
| 2006 | 2,247.5 |
| 2007 | 1,911.1 |
| 2008 | 1,427.8 |
| 2009 | 688.0 |
| 2010 | (295.3) |

(ඇ) 2006 වර්ෂයේ සිට ආයෝජන සීඝ්‍රයෙන් අඩුවී තිබුණු අතර, පහත දැක්වෙන පරිදි 2009 හා 2010 වර්ෂවලදී ආයෝජනවලින් ලැබෙන ආදායමෙහිද සීඝ්‍ර අඩුවීමක් වාර්තා විය.

| වර්ෂය | ආයෝජන | පොලී ආදායම |
|---|---|---|
| | රු. මිලියන | රු.මිලියන |
| 2005 | 2,488.6 | 198.9 |
| 2006 | 1,985.3 | 264.4 |
| 2007 | 1,656.0 | 251.3 |
| 2008 | 1,256.1 | 243.9 |
| 2009 | 582.2 | 138.9 |
| 2010 | 3.5 | 14.9 |

ඉහත තොරතුරු අනුව, 2005 වර්ෂයේදී රු.මිලියන 2,488.6 ක්වූ ආයෝජන 2010 වර්ෂයේදී රු.මිලියන 3.5 ක් එනම් 99.9% ක් දක්වාද 2006 වර්ෂයේදී රු.මිලියන 264.4 ක් වූ පොලී ආදායම 2010 වර්ෂයේදී රු.මිලියන 14.9 ක් එනම් 94.4% ක් දක්වාද අඩුවී තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

2.2.1 කාර්යසාධනය

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා බඳවා ගැනීම් 10,000 කගෙන් රු.55,478,000 ක් වූ දායක මුදල රැස්කර ගැනීමට ඉලක්ක කර තිබුණද, දායකයන් 4,902 කගෙන් තථ්‍ය දායක මුදල් රැස්කර ගැනීම රු.11,459,433 ක් විය. ඒ අනුව, තථ්‍ය මූල්‍ය ඉටුකර ගැනීම 20.6% ක් වූ අතර තථ්‍ය දායක බඳවා ගැනීම් 49% ක් විය. දිස්ත්‍රික්ක 06 ක ඉටුකරගැනීමේ ප්‍රගතිය 10% කට වඩා අඩු විය.

2.2.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෝජනා ක්‍රමයේ දායකයන්ගේ පෞද්ගලික ගිණුම් පරිගණකගත කිරීම සඳහා 1987 වර්ෂයේ සිට රු.මිලියන 21.5 ක මුදලක් ගෙවා තිබුණද යෝජනා ක්‍රමය ස්ථාපිත කර වර්ෂ 22 ක් ගතවීත් 2010 දෙසැම්බර් 31 දිනට ගිණුම් යාවත්කලීන කර නොතිබුණු අතර කේවල දායකයන්ගේ පසු වාරික පරිගණකගත කර නොතිබුණි. ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ දායක මුදල් ගෙවීමට සුදුසුකම් ලබන දායකයන් තීරණය කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් තොරතුරු යෝජනා ක්‍රමය සතුව නොතිබුණි. එමෙන්ම දිස්ත්‍රික් කාර්යාල මගිනද දායකයන්ගේ පරිගණකගත දත්ත යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා නව පරිගණක පද්ධතියක් සංවර්ධනය කිරීමට 2008 වර්ෂයේදී කොළඹ විශ්ව විද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඒ සඳහා දරන ලද වියදම රු.5,479,120 ක් විය. ගිවිසුමට අනුව ව්‍යාපෘතිය මාස 06 ක් තුල නිම කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එය නිමකර නොතිබුණි.

2.2.3 මූල්‍ය කළමනාකරණය

-------------------------

යෝජනා ක්‍රමයෙන් ඉවත්ව ගිය දායකයන්ගේ සංඛ්‍යාව සහ සමාලෝචිත වර්ෂයේදී දෙවැනි සහ පසු වාරික අඩියරයන්හි ඉවත්ව ගිය සංඛ්‍යාවට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 සැප්තැම්බර් 26 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව, මාවිල් ආරු සොරොව්ව වසා දැමීම හේතුවෙන් විපතට පත් ගොවීන්ට වන්දි ගෙවීම සඳහා රු. මිලියන 176 ක් වෙන් කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද මෙම කාර්යය සඳහා රු.194,169,155 ක් වූ ආයෝජන, වට්ටම් කර තිබුණු අතර රු.120,198,639 ක මුදලක් වන්දි මුදල් ලෙස ගෙවා තිබුණි. ගෙවන ලද වන්දි මුදල් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදලක් ලෙස අඛණ්ඩව දක්වා තිබුණි.

(ආ) යෝජනා ක්‍රමය කළමනාකරණය කරනු ලැබ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු හා එක් සහකාර අධ්‍යක්ෂවරයෙකු විසින් 2008 වර්ෂයේදී රු.2,791,679 ක් වටිනා චෙක්පත් 48 ක් හා රු.7,152,249 ක් වටිනා බැංකු අණකර වංචා කර තිබුණි. මේ සම්බන්ධයෙන් මහාධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බව මණ්ඩලය මා වෙත දන්වා තිබුණි.

2.2.5 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ) පරිගණකගත පද්ධතිය

(ආ) මූල්‍ය කළමනාකරණය

(ඇ) විශ්‍රාම වැටුප් ගෙවීම හා නොගෙවන ලද විශ්‍රාම වැටුප්